වාර්ෂික වාර්තාව
ஆண்டு அறிக்கை
ANNUAL REPORT
2024



තල් සංවර්ධන මණ්ඩලය
பனை அபிவிருத்திச் சபை
PALMYRAH DEVELOPMENT BOARD

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය
பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சு
MINISTRY OF PLANTATION AND COMMUNITY INFRASTRUCTURE

වාර්ෂික වාර්තාව 2024

ஆண்டறிக்கை 2024

Annual Report 2024



වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சு

Ministry of Plantation and Community Infrastructure

තල් සංවර්ධන මණ්ඩලය

பனை அபிவிருத்திச் சபை

Palmyrah Development Board

වාර්ෂික වාර්තාව

2024

අපගේ දැක්ම/ எமது தூரநோக்கு / Our Vision

තල් ආශ්‍රිත නිෂ්පාදන දේශීය සම්පත් හා පරිසරයේ යහ පැවැත්ම තහවුරු කරන අතර රටේ දළ ගෘහස්තනිෂ්පාදනයෙහි තීරණාත්මක දායකය බවට සංවර්ධනය කිරීම

வளங்களையும் சூழலையும் அழியாமல் பாதுகாக்கும் அதே வேளையில் நாட்டின் மொத்த உள்நாட்டு உற்பத்திக்கு அர்த்தம் மிகுந்த பங்களிப்பைக் கொடுக்கும் பனை வளங்களை அபிவிருத்தி செய்வது.

To develop the Palmyrah sector into significant contributor to the Gross Domestic Product of the country while sustaining the resources and its environment.

අපගේ මෙහෙවර/ எமது பணிக்கூற்று / Our Mission

තල් කර්මාන්තය හා සම්පත් ක්‍රමානුකූලව දියුණුකිරීම සහ නගා සිටුවීම

பனைக் கைத்தொழிலையும் பனை வளங்களையும் ஒழுங்குபடுத்தி அபிவிருத்தி செய்தலும் முன்னேற்றுகலும்.

To regularize develop and promote Palmyrah industry and Palmyrah resources

අන්තර්ගතය **පිටු අංකය**

සභාපතිවරයාගේ වාර්තාව 1
සාමාන්‍යාධිකාරීගේ වාර්තාව 2
1) තල් සංවර්ධන මණ්ඩලය පිළිබඳ හැඳින්වීම 3
1.1 අරමුණු සහ ඉලක්ක 3
2) සංස්ථායික පාලනය
2.1 අධ්‍යක්ෂ මණ්ඩලය 4
2.2 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 4
2.3 විගණන හා කළමනාකරණ කමිටුව 5
2.4 අභ්‍යන්තර පාලනය 6
2.5 කළමනාකරණය 6
3) සංස්ථාපිත තොරතුරු 7
4) තල් සම්පත් හා ප්‍රයෝජනය 8
5) වෘත්තීන්ට අදාළ අංශයන්හි කාර්ය සාධන වාර්තාව
5.1 සංවර්ධන අංශය 9
5.2 ව්‍යාප්ති අංශය 13
5.3 පරිපාලන අංශය 14
5.4 නිෂ්පාදන අංශය 19
5.5 අලෙවිකරණ අංශය 23
5.6 පර්යේෂණ අංශය 25
5.7 මූල්‍ය සමාලෝචනය 29
5.8 අවදානම් කළමනාකරණය 30
5.9 උපායමාර්ගික ක්‍රියාමාර්ග 31
5.10 මානව ප්‍රාග්ධනය 32
5.11 පාරිසරික වාර්තාකරණය 32
5.12 අභියෝග 32
6) සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති
6.1 පොදු ගිණුම් ප්‍රතිපත්ති 34
6.2 වත්කම් හා තක්සේරු කිරීමේ පදනම 34
6.3 බැරකම් හා ප්‍රතිපාදන 36
6.4 ආදායම් ප්‍රකාශය 36
6.5 මුදල් ප්‍රවාහය 38
6.6 රජයේ ප්‍රදානයන් 38
7) මූල්‍ය ප්‍රකාශ - අනාවරණ
7.1 ශේෂ පත්‍රය 38
7.2මූල්‍ය කාර්‍ය සාධනය ලාභ හා අලාභ ගිණුම 39
7.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 40
7.4 මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රකාශය 42
7.5 විසර්ජන වෙන්කිරීම් 43
7.6 හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය 46
7.7 මූල්‍ය ප්‍රකාශයන්ට සටහන් අංක 1 සිට 18 59
8) විගණකාධිපතිගේ වාර්තාව 66
8.1 විගණන වාර්තාවේ පෙන්වා දී ඇති අඩුපාඩුකම් නිවැරදි කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග 72

සභාපතිතුමාගේ ප්‍රකාශය



සභාපතිවරයා ලෙස, 2024 වසර සඳහා වන වාර්ෂික වාර්තාව සඳහා මගේ පණිවිඩය ඉදිරිපත් කිරීමට ලැබීම ගැන බෙහෙවින් සතුටු වෙමි. මෙම වසරේදී තල් සංවර්ධන මණ්ඩලය ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා තල් ආශ්‍රිත අපනයනය ප්‍රවර්ධනය කිරීමෙහිලා සලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කර ඇත. විශේෂයෙන් 2023 වර්ෂයේදී රුපියල් මිලියන 57.83 ක් වූ තල් ආශ්‍රිත අපනයනය මෙම වර්ෂයේදී රු. මිලියන 228.69 දක්වා ඉහළ ගොස් ඇත.

තල් සම්පත මුළුමනින්ම ප්‍රයෝජනයට නොගැනීම තල් කර්මාන්තයට තවමත් පවතින ප්‍රධානතම අභියෝගයකි. මෙය නිරාකරණය කිරීම සඳහා වටිනාකම් දාමයෙහි විවිධ අදියරවල උත්සාහයන් දරන ලදී. 2024 වර්ෂයේදී අළුත් රැකියා අවස්ථාවන් බිහිකිරීම, නිෂ්පාදන අංශ ශක්තිමත් කිරීම, වෙළඳපොළ ප්‍රවේශය ප්‍රවර්ධනය කිරීම සහ තල් සම්පත සංරක්ෂණය වැනි කටයුතු කෙරෙහි තල් සංවර්ධන මණ්ඩලය අවධානය යොමු කිරීම තුළින් විදේශ ආදායම වැඩිකිරීමට සහ කර්මාන්තයේ දියුණුවට දායක වීමට හැකි විය.

මෙම සාර්ථකත්වයට අපගේ කොටස්කරුවන් සහ තල් සංවර්ධන මණ්ඩලයේ කැපවීමෙන් යුතු සේවකයින් විසින් ලබාදෙන ලද සහයෝගය හේතු විය. මෙම වර්ෂය පුරාවටම අපගේ කාර්යයට සහයෝගය ලබාදුන් සියළු දෙනාට මගේ හෘදයාංගම ස්තුතිය පළ කරමි.

වී.සහදේවන්,
සභාපති
තල් සංවර්ධන මණ්ඩලය

සාමාන්‍යාධිකාරිගේ ප්‍රකාශය



සාමාන්‍යාධිකාරි වශයෙන් 2024 වාර්ෂික වාර්තාවට මාගේ ප්‍රකාශය ප්‍රකාශය ලබාදීම ගැන සතුටු වෙමි. තල් ගස අපගේ නිෂ්පාදකයින්ගේ ජීවනෝපායට දායකත්වය සපයන සාම්ප්‍රදායික වගාවකි. විවිධ වටිනාකම් එකතුකළ භාණ්ඩ නිෂ්පාදනයට ඇති හැකියාව සහ රටේ ආර්ථිකයට දායක විය හැකි ශක්තිය පැවතියද මෙය තවමත් සම්පූර්ණයෙන් භාවිතයට නොගන්නා සම්පතක් වශයෙන් පවතී. වගකීමක් සහිත රාජ්‍ය ආයතනයක් වශයෙන් ආදායම් ඉපයීමේ ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම සඳහා සහ ආංශික කාර්ය සාධනය නැංවීම සඳහා මෙම වසරේ දී අවධානය යොමු කරන ලදී.

අපගේ කටිපහම් අලෙවි මධ්‍යස්ථානය මගින් රුපියල් 62,951,707.79 ක ආදායමක් උපයා ගන්නා ලද අතර, පරීක්ෂණ වාර්තා සහ විද්‍යාගාර සේවාවන් තුළින් රුපියල් මිලියන 1.64 ක ආදායමක් ලැබුණි. ඵලදායිතාවය වැඩි කිරීම සඳහා අපගේ නිෂ්පාදන මධ්‍යස්ථාන මගින් රුපියල් මිලියන 38.82 ක වටිනාකමින් යුතු අගය එකතුකළ භාණ්ඩ නිෂ්පාදනය කරන ලදී. තවද, පුහුණුලාභීන් 556 දෙනෙකුට හස්ත කර්මාන්ත පුහුණුව පුහුණුලාභීන් 35 දෙනෙකුට පළතුරු යුෂ නිෂ්පාදන පුහුණුව ලබාදෙන ලදී. තල් පර්යේෂණ ආයතනය පර්යේෂණ 06 ක් සිදුකර විවිධ තාක්ෂණික ව්‍යාප්ති ක්‍රමවේදයන් ක්‍රියාත්මක කළේය. තල් ගස් සැලසුමකින් තොරව කපාහැළීම වැලැක්වීම සඳහා අවදානම් සහිත ගස් ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලදී.

ආයතනයේ කාර්ය සාධනය ප්‍රවර්ධනය කිරීමට මානව සම්පත් ආශ්‍රිතව පරිපාලනය, කළමණාකරණය සහ මූල්‍ය පිළිබඳ පුහුණුවීම් සේවකයින් හට ලබාදෙන්නා ලදී. අපනයනකරුවන්ට බලපත්‍ර ලබාදුන් අතර, ඔවුන්ගේ නිෂ්පාදන හඳුන්වාදීම සඳහා සහ නිෂ්පාදකයින් සමඟ සම්බන්ධීකරණය කිරීම සඳහා අපනයනකරුවන් සමඟ සංවාද මණ්ඩප පවත්වන ලදී.

මෙම වර්ෂය තුළ ළඟා කරගත් කාර්ය සාධනයට දායක වූ සියළු පාර්ශවයන්ට සහ සේවකයින්ට මගේ ගෞරව පූර්ව ස්තුතිය පුදකරමි.

එස්. ශ්‍රීවිජේන්ද්‍රන්,
සාමාන්‍යාධිකාරී
තල් සංවර්ධන මණ්ඩලය

1. තල් සංවර්ධන මණ්ඩලය පිළිබඳ හැඳින්වීම.

තල් සංවර්ධන මණ්ඩලය 1971 වසරේ 46 වැනි අංකය දරණ ශ්‍රී ලංකා පොල් සංවර්ධන පනතේ සංශෝධනය මත පදනම්ව, 1975 වසරේ අංක 24 වැනි පනතේ ප්‍රකාරයෙන්, 1978 වසරේ අගෝස්තු මස 18 වෙනි දින නිකුත් වූ ගැසට් නිවේදනයක් අනුව, වැවිලි අමාත්‍යාංශය යටතේ තල් සම්බන්ධ කර්මාන්ත ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා පිහිටුවන ලද ආයතනයකි. 2024 වසරේ නොවැම්බර් 25 වෙනි දින නිකුත් කරන ලද 2412/8 වැනි ගැසට් නිවේදනය මගින්, එය තවදුරටත් ක්‍රියාත්මක වන්නේ වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය යටතේ ය.

1.1. අරමුණු සහ ඉලක්ක

- තල් සම්බන්ධව ඇති සමාජ හා ආර්ථික සංවර්ධනයට දායක වන ආයතනික පදනමක් පිහිටුවීම.
- ශ්‍රී ලංකාවේ තල් පදනම්ව ඇති කර්මාන්ත ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනය සඳහා ක්ෂුද්‍ර මධ්‍යම හා උසස් තාක්ෂණික මට්ටමේ විද්‍යාත්මක දියුණු පදනමක් ස්ථාපිත කිරීම.
- මූලික ක්‍රමවේද සහ උසස් තාක්ෂණ සංවර්ධනය සඳහා පරීක්ෂණාත්මක පර්යේෂණ මගින් තල් වගාව පිළිබඳ ආරක්ෂාව, පවත්වා ගැනීම, නිෂ්පාදනය හා සංවර්ධනය සඳහා අවශ්‍ය තාක්ෂණයන් වර්ධනය කිරීම.
- ඒකාබද්ධ සංවර්ධන උත්සාහයන් මූලික කරගෙන, තල් හා පශු සම්පත් සම්බන්ධ වගා ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම මඟින් තල් වගා ඉඩම්වල නිෂ්පාදන හැකියාව වැඩි කිරීම.
- තල් සංවර්ධන මණ්ඩලය මගින් සකස් කරන ලද තාක්ෂණික ක්‍රමවේද, මෙම ක්ෂේත්‍රයේ නිරත වන පුද්ගලයින් සහ ව්‍යාපාරිකයින්ට උපයෝගී වන පරිදි තාක්ෂණ හුවමාරුවක් ලෙස ලබාදීම.
- තල් වල ජාතික ජාන සම්පත් ආරක්ෂා කිරීම හා උසස් තත්ත්වයේ තල් පැළ නිෂ්පාදනය කිරීම.
- තල් සම්බන්ධ තාක්ෂණික දත්ත ප්‍රායෝගික අත්දැකීම්වලට යාවත්කාලීනව ගලපා, ජනප්‍රිය තොරතුරු සමඟ සසඳා පළ කිරීම හා විසරණය කිරීම.
- තල් සම්බන්ධ ආයතනික සංවර්ධනය සහ සහයෝගීතාවයන් මඟින් නිෂ්පාදන කළමනාකරණ ක්‍රමවේදයන් ව්‍යුහගත කර යාවත්කාලීන කිරීම සහ ඒවා පහසු කිරීම.

2. සංස්ථාපිත පාලනය

අපි ලංකාවේ **වරලත් ගණකාධිකාරීවරුන්ගේ** ආයතනය, **රාජ්‍ය ව්‍යවසාය** දෙපාර්තමේන්තුව සහ මුදල් අමාත්‍යාංශය විසින් හඳුන්වා දී ඇති ක්‍රියාමාර්ග සහ වගකිව යුතු අමාත්‍යාංශය විසින් ලබා දී ඇති නිර්නායකයන් අනුගමනය කරමු.

2.1 අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලය සාමාන්‍ය වශයෙන් සාමාජිකයින් 7 දෙනෙකුගෙන් සමන්විතය. මෙම සාමාජිකයින් ගරු අමාත්‍යතුමා විසින් පත්කිරීම් කරනු ලැබේ. මෙම මණ්ඩලයේ එක් සාමාජිකයෙකු මූල්‍ය අමාත්‍යාංශය සඳහා වගකිවයුතු අමාත්‍යතුමාගේ නියෝජිතයා ලෙස තේරී පත්වන අතර, ඔහු මණ්ඩලයේ මූල්‍ය කටයුතු සඳහා වගකිවයුතු සාමාජිකයා වශයෙන් ක්‍රියාකරයි. අනෙකුත් සාමාජිකයින් අතරින් එක් අයෙකු මණ්ඩලයේ සභාපතිවරයා ලෙස අමාත්‍යතුමා විසින් පත් කෙරේ.

වගුව 1: මණ්ඩලයේ සභාපතිතුමන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් - 2024

නම	තනතුර	කාලය
ආචාර්‍ය ක්‍රිශාන්ත පතිරාජ මහතා	සභාපති, තල් සංවර්ධන මණ්ඩලය	01.01.2024 – 30.10.2024
එච්. පී. කේ. පෙරේරා මහතා	අධ්‍යක්ෂ	01.01.2024 – 30.10.2024
සුමිත් ප්‍රියන්ත හල්විටිගේ මහතා	අධ්‍යක්ෂ	01.01.2024 – 23.07.2024
මහාචාර්ය සුබ්‍රමනියම් මෝහනදාස් මහතා	අධ්‍යක්ෂ	01.01.2024 – 30.10.2024
කන්දරාජා ඉලන්කෝ මහතා	අධ්‍යක්ෂ	01.01.2024 – 30.10.2024
සෙල්ලයියා සෙල්වරාසා මහතා	අධ්‍යක්ෂ	01.01.2024 – 23.07.2024
අර්.ඒ.ආර්.එස්. මායාදුන්න මහත්මිය	අධ්‍යක්ෂ	01.01.2024 – 30.10.2024
කේ. ගෝපාලක්‍රිෂ්ණන් මහතා	අධ්‍යක්ෂ	01.08.2024 – 30.10.2024
සෙල්වින් ඉරේනියස් මරියම්පිල්ලේ මහතා	අධ්‍යක්ෂ	01.08.2024 – 30.10.2024

2.2 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩලය මාසිකව රැස්වෙමින් ආයතනයේ ප්‍රතිපත්ති, පරිපාලන සහ කළමනාකරණ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සාකච්ඡා කර තීරණ ගැනීම සිදුකරයි. 2024 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 10 ක් පැවැත්වුණි.

වගුව 2: අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් විස්තරය

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම	පැවති දිනය
පළමු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම	02.01.2024
දෙවැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම	07.02.2024
තෙවැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම	16.02.2024
සිව්වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම	10.04.2024

පස්වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම	19.04.2024
හයවැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම	09.05.2024
සත්වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම	07.06.2024
අටවැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම	05.07.2024
නවවැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම	23.07.2024
දසවැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම	04.09.2024

2.3 විගණන හා කළමනාකරණ කමිටුව

විගණන හා කළමනාකරණ කමිටුව සභාපති ලෙස ක්‍රියා කරන අධ්‍යක්ෂවරයාගේ ප්‍රධානත්වය යටතේ ක්‍රියාත්මක වේ. මෙයට අදාළව, මූල්‍ය අමාත්‍යාංශය නියෝජනය කරන අධ්‍යක්ෂවරයෙකු ඇතුළුව වෙනත් අනුක්‍රමික අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු මෙහි සාමාජිකයන් ලෙස ක්‍රියාකරති. ආරාධනාවක් මත ජ්‍යෙෂ්ඨ විගණක කළමනාකරුවන් මෙම රැස්වීම් වලට සහභාගී වෙති.

මෙම කමිටුව තුළින් ආයතනයේ ක්‍රියාදාමයන්ට අදාළ නීතිමය අවශ්‍යතා සහිතව අභ්‍යන්තර පාලන ක්‍රමවේද, අවදානම් කළමනාකරණය, හා වෙනත් විධිමත් ක්‍රියාමාර්ග පිළිබඳව සමාලෝචනයක් සිදු කෙරේ.

වගුව 3: විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින් – 2024

නම	තනතුර
එච්. පී. කේ. පෙරේරා මහතා	අධ්‍යක්ෂ (AMC I & II)
කේ. එන්. එස්. රණතුංග මහත්මිය	අධ්‍යක්ෂ (AMC I)
සුමිත් හල්විටිගේ මහතා	අධ්‍යක්ෂ (AMC I & II)
කේ.ඒ.සී.සමන්ත මහතා	අධ්‍යක්ෂ (AMC I & II)
පී. පටිකුණම් මහතා	අධ්‍යක්ෂ (AMC I)
ආර්.ඒ.ආර්.ඒස්. මායාදුන්නේ මහත්මිය	අධ්‍යක්ෂ (AMC I)
කේ. නිවේදා මහත්මිය	අධ්‍යක්ෂ (AMC I)

විගණන හා කළමනාකරණ කමිටු වාර්තාවේ අරමුණු

1. මණ්ඩලයේ මධ්‍ය හා වාර්ෂික වාර්තා ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුකූලද යන්න තක්සේරු කිරීම.
2. කළමනාකරණ අභ්‍යන්තර පාලන ක්‍රමවේද පිළිබඳ වාර්තා සකස් කිරීම.
3. අභ්‍යන්තර, බාහිර හා මූල්‍ය සම්බන්ධ මෙන්ම COPE කාරක සභාව යෝජනා කළ වාර්තා ක්‍රියාත්මක වීම සනාථ කිරීම.
4. නීති හා ප්‍රතිපත්ති නිසි ලෙස ක්‍රියාත්මක වී ඇති බව සහතික කිරීම.

5. ව්‍යාපාරික අවදානම් කළමනාකරණය පිළිබඳ වාර්තා සැපයීම.
6. විගණන දෙපාර්තමේන්තුවේ වගකීම් නිසි ලෙස ඉටු වීම තහවුරු කිරීම.
7. අභ්‍යන්තර විගණකාධිකාරීන්ගේ වගකීම් නිවැරදිව ක්‍රියාත්මක වීම තහවුරු කිරීම.

2.4 අභ්‍යන්තර පාලනය

ගනුදෙනු ක්‍රියාවලියන් සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් සහ නිවැරදිව ක්‍රියාත්මක වීම සහතික කිරීම සඳහා මිල ඇගයීම් කමිටු, මිල පත් කිරීමේ කමිටු සහ මිලදී ගැනීම් කමිටු පත් කර ඇත. අභ්‍යන්තර විගණනය, මූල්‍ය ගෙවීම් සහ ලැබීම් සම්බන්ධ සියලු ක්‍රියාකාරකම් පිළිබඳව දැඩි පරීක්ෂාවක් යටතේ ක්‍රියාකරයි.

2.5 කළමනාකරණය

සාමාන්‍යාධිකාරියාගේ ප්‍රධානත්වය යටතේ, අංශ 7 ක ප්‍රධානීන් ක්‍රියාත්මක වෙති. ඔවුන් දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් සමඟ එක්ව කටයුතු කරති. එම අංශ ප්‍රධානීන් එක් එක් අංශයේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ප්‍රධාන විධායක නිලධාරියා වන සාමාන්‍යාධිකාරි වෙත වාර්තා කරයි.

වගුව 4: විධායක කළමනාකරණ සාමාජිකයින්ගේ විස්තරය

තනතුරු නාමය	නම	ජංගම දු.ක.අං	විද්‍යුත් ලිපිනය (ඊ-මේල්)
සාමාන්‍යාධිකාරී (වැ.බ.)	එස්. ශ්‍රී විජේන්ද්‍රන් මහතා	0773787380	srthyln@yahoo.com
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී	එස්. ශ්‍රී විජේන්ද්‍රන් මහතා	0773787380	srthyln@yahoo.com
කළමනාකාරු (මුදල්)	ඒ. කවිසිදරන් මහතා	0704400641	arumugaswamykaushitharan@gmail.com
කළමනාකාරු(ව්‍යාජ්ති) වැ.බ.	විජයන් මහතා	0763082491	extensionpdb@yahoo.com
කළමනාකාරු(ව්‍යවහාරික පර්යේෂණ)	ආචාර්ය අනුලක්ෂි	0762688176	anu2november@gmail.com
කළමනාකාරු(පරිපාලන හා මානව සම්පත්)	ජී.කේ. වාහලතන්ත්‍රි මහතා	0766658876	Geethkw2009@yahoo.com
කළමනාකාරු(අලෙවි ප්‍රවර්ධන)	බී. සුදාහරන් මහතා	0760233301	sbsuthaharan@yahoo.com
කළමනාකාරු(නිෂ්පාදන)	එම්. හියුබට් ඇන්ටනි මහතා	0761601113	antonygowry@yahoo.com
කළමනාකාරු(සංවර්ධන)	ඒස්. ජනාර්දනන් මහත්මිය	0772321051	Sumithira79@yahoo.com
අභ්‍යන්තර විගණක	ජේ. ශ්‍රීවානති මහත්මිය	0768688277	srivanathyj@gmail.com

3. සංස්ථායික තොරතුරු

නම : තල් සංවර්ධන මණ්ඩලය

නෛතික පදනම : **1971** අංක **46** දරන පොල් සංවර්ධන පනත සහ **1975** අංක **24** දරන පොල් සංවර්ධන සංශෝධිත පණත ප්‍රකාරව **1978** අගෝස්තු **18** දින පලකරන ලද අංක **331** දරන ගැසට් නිවේදනය මගින් තල් සංවර්ධන මණ්ඩලය ස්ථාපිත කර ඇත.

සංස්ථාපිත වර්ෂය : **1978**

වගුව **5:** ලියාපදිංචි කරන ලද කාර්යාලවල විස්තර

ලියාපදිංචි කාර්යාලය	ලිපිනය	දුරකථන /ෆැක්ස්
ප්‍රධාන කාර්යාලය	තල් සංවර්ධන මණ්ඩලය, නුවර පාර, යාපනය.	021 2222034 021 2224154
නගර කාර්යාලය	498, ගාලු පාර, කොළඹ - 06	011 2364406 011 2364405
ප්‍රාදේශීය කාර්යාලයන්		
මඩකලපුව	බාර් පාර, මඩකලපුව.	065 2223179
ත්‍රිකුණාමලය	ඇතුළත වරාය පාර, ත්‍රිකුණාමලය.	026 2224039
අම්පාර	අංක 20, ජාතික නිවාස ලේකම් කාර්යාල ගොඩනැගිල්ල, කල්මුනෙයි.	067 2220405
පුත්තලම	බස් ස්ථානය අසල, කල්පිටිය.	032 2260749
මන්නාරම්	පන්සල පාර, සාන්තිපුර, මන්නාරම	023 0000373
වවුනියාව	අංක 67-68, බසාර් වීදිය, වවුනියාව.	024 2222483
මුලතිව්	A9 පාර, මාන්කුලම්, මුලතිව්	021 2060042
කිලිනොච්චි	නුවර පාර, කිලිනොච්චිය.	021 2285638
හම්බන්තොට	වැල්ලවාය පාර, වීරවිල.	047 3221201

විද්‍යුත් තැපෑල : slpdbho@yahoo.com

වෙබ් අඩවිය : www.pdb.gov.lk

විගණකවරු : විගණකාධිපති දෙපාර්තමේන්තුව

නීති උපදේශක : නීතිපති දෙපාර්තමේන්තුව

බැංකුකරු : ලංකා බැංකුව

තල් සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය යාපනයේ පිහිටා ඇති අතර, එය ප්‍රාදේශීය කාර්යාල නවයකින් 'කටිපහම්' නමින් ප්‍රකට විකුණුම් මධ්‍යස්ථාන 14 ක්, නිෂ්පාදන මධ්‍යස්ථාන 11 කින්, එක් පර්යේෂණ මධ්‍යස්ථානයකින්, එක් තල් අරක්කු ස්කාගාරයකින් හා ආදර්ශ තල් ගොවිපලකින් සමන්විත ජාලයක් හරහා දීප ව්‍යාප්ත පදනමකින් සිය කටයුතු සිදු කරයි. කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලය සෙසු

ප්‍රාදේශීය කාර්යාල, අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය හා වෙනත් වැදගත් ආයතන සඳහා සම්බන්ධීකරණ කටයුතු සිදු කරයි. තල් සංවර්ධන මණ්ඩලය වනාහි තල් මත යැපෙන පවුල් මෙන්ම සාම්ප්‍රදායික තල් කර්මාන්ත දියුණු කිරීම සඳහා සේවය සලසන එකම රජයේ සංවිධානයයි.

4.<u>තල් සම්පත් හා ඒවායේ ප්‍රයෝජන</u>

Borassus flabellifer යන උද්භිද විද්‍යාත්මක නාමය හිමි තල් ශාකය සර්ම කලාපික නියඟයට ඔරොත්තු දෙන ශක්තිමත්ම බෝගයකි. තල් ගස දකුණු අප්‍රිකාව, අග්නිදිග ආසියාව, උතුරු ඉන්දුනීසියාව හා ඉන්දියාව ශ්‍රී ලංකාව යන රටවල හමුවේ. එය ශ්‍රී ලංකාවේ, විශේෂයෙන්ම උතුරු නැගෙනහිර පළාත් තුළ ජනතාවගේ ජීවනෝපාය සමග සාම්ප්‍රදායිකවම බැඳී තිබේ.

වගුව 6 : ලංකාවේ තල් ගස් ව්‍යාප්තිය

අංකය	දිස්ත්‍රික්කය	තල් ගස් සංඛ්‍යාව
01	යාපනය	3 500 000
02	කිලිනොච්චිය	3 500 000
03	මන්නාරම	3 000 000
04	මුලතිවු	500 000
05	ත්‍රිකුණාමලය	210 000
06	මඩකලපුව	200 000
07	පුත්තලම	120 000
08	අම්පාර	40 000
09	අනුරාධපුර	40 000
10	වවුනියාව	8 000
11	හම්බන්තොට	2 000
එකතුව		11 120 000

වගුව 7: තල් ආශ්‍රිත නිෂ්පාදන

තෙලිජ්ජ ආශ්‍රිත නිෂ්පාදන: ✓ පැණි රස කාරක - හකුරු, පැණි, මී රා හා සූකිරි ✓ මධ්‍යසාර - අරක්කු හා බෝතල් කළ රා ✓ පැසවන ලද නිෂ්පාදනය - විනාකිරි	
තල් යුෂ ආශ්‍රිත නිෂ්පාදන: ✓ බෝතල් කරන ලද යුෂ පිනාටු, පැනි පිනාටු, ජෑම්, කෝඩියල්, පිළිගැන්වීමට සූදානම් පානය, ඖෂධ ආශ්‍රිත නිෂ්පාදන	

තල් අල ආශ්‍රිත නිෂ්පාදන: ✓ අල (නැවුම්), වියලූ අල, වියලූ අල පිටි, තම්බන ලද අල පිටි, පාම් පෝෂ, බිස්කට්, කේක්	
තල් පත්‍ර ආශ්‍රිත නිෂ්පාදන: ✓ සාම්ප්‍රදායික අත්කම්: වියන ලද කූඩ , වියන ලද පුටු, කජු තේ හා කුළු බඩු ඇසුරුම් පෙට්ටි, තොප්පි, පැදුරු, ඉරටු නිෂ්පාදන, කෙඳි නිෂ්පාදන, දත් කූරු, බිත්ති සැරසිලි, මේස දරණු, මල් කූඩ, කූලු, පෙට්ටි, අත් බෑග්	
තල් කෙඳි ආශ්‍රිත නිෂ්පාදන: ✓ **තද කෙඳි -**බර වැඩ සඳහා සාදන ලද බුරුසු, මධ්‍යම කෙඳි - පිරිසිදු කිරීම හා ගෙදර දොර කාර්ය සඳහා සාදන ලද බුරුසු, මෘදු කුඩු - උද්‍යාන වගා මාධ්‍යයක් ලෙස	
තල් දැව ආශ්‍රිත නිෂ්පාදන: ✓ වහල සඳහා දැව ලෙස ,ගෘහ භාණ්ඩ, දර සඳහා	

5. <u>වත්තීය අංශවල කාර්යසාධනය සමාලෝචනය කිරීම</u>

5.1. තල් වගා සංවර්ධන අංශය

තල් නැවත වගාව, තල් ගස් කැපීම පාලනය කිරීම, තල් ගොවිපලවල් පාලනය, සැලසුම් සකස් කිරීම සහ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම මෙම අංශය විසින් සිදුකරණු ලබයි. මෙම වර්ෂයේදී තල් වගාවට මුදල් ප්‍රතිපාදන වෙන් නොකිරීම නිසා මෙම වැඩසටහන ප්‍රජා ස්වේච්ඡා සංවිධානවල සහභාගිත්වයෙන් සිදුකරණු ලැබීම විශේෂත්වයකි. තල් වගා සඳහා වූ තල් පැළ තල් සංවර්ධන මණ්ඩලය විසින් සපයන ලදී.



රූපය 1: තල් පැළ වගාව මන්නාරම දිස්ත්‍රික්කය



රූපය 2: තල් පැළ වගාව යාපනය දිස්ත්‍රික්කය

5.1.2 තල් ගස් කැපීම පාලනය

සැලසුම් රහිත තල් ගස් කැපීම තල් කර්මාන්ත ක්ෂේත්‍රයට විශාල අභියෝගයක් වී ඇත. අත්‍යවශ්‍ය ගෘහ අවශ්‍යතා සඳහා පමණක්, ඵලදීම අවසන් වූ වයස්ගත වගා ගස් කපා හැරීමට අවසර ලබාදෙන නමුත්, මාර්ග පුළුල් කිරීම, විදුලි බෙදාහැරීම, විශේෂ ව්‍යාපෘති සහ වෙනත් කෘෂිකර්ම කටයුතු සඳහා භූමි පිරිසිදු කිරීම වැනි අවශ්‍යතාත් නිසා තල් ගස් කැපීම වැඩිවීමට හේතු වී ඇත.

සැලසුම් රහිත තල් ගස් කැපීමෙන් උදාවන දැඩි ප්‍රතිවිපාක සලකා බලා, තල් සංවර්ධන මණ්ඩලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලැබෙන තල් කැපීම සඳහා වන අයදුම්පත්‍ර ක්ෂේත්‍ර නිලධාරීන් විසින් පරීක්ෂා කර, අවසරය ලබාදීමට පෙර නිර්දේශ ලබාදෙයි. මෙයට අමතරව, නීති විරෝධී තල් ගස් කැපීමේ ක්‍රියා මර්දනය කිරීම සඳහා ග්‍රාම නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම් කාර්ය මණ්ඩලය සමඟ එක්ව පොලිසියට දැනුම්දීම සහ වන්දි වාර්තා ලබාදීම වැනි සේවාද සිදු කරයි. මෙවැනි පාලන ක්‍රියාමාර්ග නිසා තල් කැපීම සැලකිය යුතු ලෙස අඩු වී ඇත.

වගුව 8 : පසුගිය වර්ෂ තුන තුළ අවසර ලබාගෙන ගස් කපා හෙලීම පිළිබඳ විස්තර

අංකය	දිස්ත්‍රික්කය	2022	2023	2024
01	යාපනය	7,382	4,837	3,238
02	මන්නාරම	1,232	843	901
03	වවුනියාව	355	180	91
04	කිලිනොච්චි	846	622	347

05	**මුලතිවු**	**823**	**291**	**247**
06	**ත්‍රිකුණාමලය**	**338**	**371**	**273**
07	**මඩකලපුව**	**342**	**596**	**292**
08	**අම්පාර**	**143**	**28**	**47**
09	**පුත්තලම**	**-**	**296**	**87**
	මුළු එකතුව	**11,461**	**8,064**	**5,523**

5.1.3 ආදර්ශ තල් ගොවිපල

බහුතර වගා භූමියන් රජයට අයත් ඉඩම් වන අතර, එවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් තල් වගා කටයුතු සඳහා ලබා දී ඇත. මෙම ඉඩම්වල තල් බීජ රෝපණය කර, තල් සංවර්ධන මණ්ඩලයෙහි ආදර්ශ තල් වගා භූමියන් ලෙස සංවර්ධනය සිදු කර ඇත. බහුතර ඉඩම් සාම්ප්‍රදායික කෘෂිකර්ම වගා සඳහා සුදුසු නොවන අතර, මින් කිහිපයක පමණක් සුදුසු අතුරු බෝග වර්ග වගා කර ඇත. මෙය මහජනතාවට තම පලදායිතාවයෙන් තොර ඉඩම් ප්‍රයෝජනයට ගැනීම සඳහා වූ ආදර්ශයෙකි.

ආදර්ශ වගා භූමියන්, තල් කර්මාන්තය සඳහා දීර්ඝකාලීන ආයෝජනයක් වේ. අවශ්‍ය ඵල ලබාගත හැක්කේ ගස පරිණත වූ පසුවය. ගස පරිණත වීමට අධික කාලයක් ගත වන බැවින්, ආදායමක් ලැබීම මූලිකව බලාපොරොත්තු විය නොහැක. පහත දැක්වෙන බහුතර ආදර්ශ වගා භූමියන් තරුණ තල් ගස් සහිත බැවින්, අනාගතයේ වඩාත් ප්‍රභල ප්‍රතිඵල ලබා ගැනීම සඳහා එම වගා නිසි ලෙස නඩත්තු කිරීම අත්‍යවශ්‍ය වේ.

තල් සංවර්ධන මණ්ඩලය විසින් හතකට අධික වගා භූමියන් නඩත්තු කරන ලද නමුත්, වගා භූමියන් නඩත්තු කිරීම සඳහා වූ වියදම් එම වගාවලින් ලබා ගත හැකි ආදායමට වඩා වැඩිවීම හා එවැනි සියළු වගා භූමියන් නඩත්තු කිරීමට අවශ්‍ය කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම යන කරුණු හේතුවෙන්, දැනට පහත දැක්වෙන වගා භූමියන් 3ක් පමණක් නඩත්තු කරනු ලබයි.

වගුව 9: දැනට නඩත්තු වන ආදර්ශ තල් ගොවිපල පිළිබඳ විස්තර

දිස්ත්‍රික්කය	ස්ථානය හා ප්‍රමාණය	ප්‍රධාන බෝග
යාපනය	මාමුනයි - අක්කර 200 යි	තල් ගස් හා කජු
වවුනියාව	පුලියන්කුලම් - අක්කර 10 යි.	තරුණ තල් ගස්, කජු
හම්බන්තොට	වීරවිල - අක්කර 10 යි.	තල් ගස් සහ කෙසෙල් වැනි වාර්ෂික බෝග

තල් කර්මාන්ත ආශ්‍රිත කටයුතු

තල් සංවර්ධන මණ්ඩලය තුළ වෙනම සැලසුම් අංශයක් නොමැති බැවින්, තල් වගා සංවර්ධන අංශය මගින් තල් කර්මාන්තය සම්බන්ධ පහත සඳහන් සැලසුම් ක්‍රියාවලී වල යෙදී ඇත.

- වාර්ෂික ක්‍රියාත්මක සැලසුම් වාර්තාවන් සකස් කිරීම සහ ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම
- තල් කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා සැලසුම් යෝජනා සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම
- තල් සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තා සකස් කිරීම
- තල් කර්මාන්තය සම්බන්ධ තොරතුරු එකතු කිරීම සහ ලබාදීම

වගුව 10: 2024 වසර සඳහා තල් සම්බන්ධ නිෂ්පාදකයින්ගේ විස්තරය

නිෂ්පාදන	නිෂ්පාදකයින් සංඛ්‍යාව	නිෂ්පාදන කණ්ඩායම් සංඛ්‍යාව
රා නිෂ්පාදනය	**2,920**	**36**
අත්කම් නිෂ්පාදන	**2,208**	**50**
තල් අල නිෂ්පාදනය	**2,435**	**-**
තල් යුෂ	**475**	**27**
ආහාර නිෂ්පාදනය	**40**	**-**

වගුව 11: තල් සම්බන්ධ නිෂ්පාදන ප්‍රවණතාවය

වර්ෂය	තල් රා (බෝතල්)	තල් අරක්කු (බෝතල්)	තල් හකුරු (කි.ග්‍රෑ.)	තල් අල (කි.ග්‍රෑ.)	පිනාටු (කි.ග්‍රෑ.)	තල් යුෂ (ලීටර්)	අත්කම් නිෂ්පාදන (රු.මිලියන)	දැව
2022	**7,508,975**	**210,000**	**65,000**	**360,000**	**6,000**	**35,000**	**38.0**	**15,339**
2023	**7,000,000**	**120,000**	**61,000**	**403,000**	**7000**	**27,394**	**51.0**	**8,064**
2024	**10,592,000**	**26,000**	**58,000**	**336,000**	**6,800**	**46,834**	**49.5**	**5,748**

5.2. ව්‍යාප්ති අංශය

තල් සංවර්ධන මණ්ඩලය විසින් තල් සම්බන්ධ කුඩා කර්මාන්තයන් සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් වාර්ෂිකව ව්‍යාප්ති අංශය ඔස්සේ සපයනු ලැබේ. තල් නෙලීම, තල් යුෂ සකස් කිරීම, තල් ගසට නැගීම, අත්කම් නිෂ්පාදන, තල් ආහාර සම්බන්ධ පුහුණු වැනි තාක්ෂණික පුහුණු වැඩසටහන් සපයමින් නිෂ්පාදනයට එක්කරන ලදී. මෙම නිෂ්පාදකයින් තල් සම්බන්ධ නිෂ්පාදකයින්ගේ සංගමයට සම්බන්ධ කරමින්, "කටිපහම්" විකුණුම් මධ්‍යස්ථාන ඔස්සේ වෙළඳපොළට පිවිසීමට අවස්ථාව සපයා ඇත.

වගුව 12: 2024 වසර සඳහා ලබාදෙන ලද පුහුණු වැඩසටහන්

වැඩසටහන	මූල්‍ය ආධාර	පුහුණු වැඩසටහන් ගණන	පුහුණුලාභීන් සංඛ්‍යාව
මාස 6 ක අත්කම් පුහුණුව	ප්‍රාග්ධනය	04	100
මාස 6 ක අත්කම් පුහුණුව	තල් සංවර්ධන මණ්ඩලය	14	283
මාස 9 ක අත්කම් පුහුණුව	ජී.අයි.ඉසෙඩ්.	08	173
එකතුව		26	556
යුෂ පුහුණුව	ප්‍රාග්ධනය	02	35
තල් ගස් මදින්නන් සඳහා	ප්‍රාග්ධනය	02	20
පුහුණුකරුවන් සඳහා පුහුණුව	ප්‍රාග්ධනය	01	35

වගුව 13: පසුගිය වසර තුනෙහි තල් කර්මාන්තය පුහුණුලාභීන්ගේ සංඛ්‍යාව

දිස්ත්‍රික්කය	2022 පුහුණුලාභීන්	2023 පුහුණුලාභීන්	2024 පුහුණුලාභීන්
යාපනය	168	86	96
කිලිනොච්චි	24	50	78
මුලතිවු	23	20	20
වවුනියාව	30	20	25
මන්නාරම	64	68	49
පුත්තලම	31	-	-
ත්‍රිකුණාමලය	75	39	79
මඩකලපුව	191	121	142

අම්පාර	103	75	45
හම්බන්තොට	39	-	22
කුරුණෑගල	18	-	-
අනුරාධපුර	23	-	-
මුළු එකතුව	789	479	556

වගුව **14:** පසුගිය වසර 5හි තල් කර්මාන්ත නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන විස්තරය.

වර්ෂය	නිෂ්පාදකයින්ගේ සංඛ්‍යාව	තල් සංවර්ධන මණ්ඩලයට විකුණූ වටිනාකම (රු. මිලියන)	නිදහස් වෙළඳපොළට විකුණූ වටිනාකම (රු. මිලියන)
2020	2364	8.64	28.00
2021	2384	7.96	36.00
2022	2634	14.93	46.00
2023	2776	19.97	52.00
2024	2546	16.30	65.00



*රූපය **3 :** අත්කම් පුහුණුව*



*රූපය **4:** තල් යුෂ පුහුණුව*



*රූපය **5:** නාව නිර්මාණ*

5.3 පරිපාලන අංශය

5.3.1 මානව සම්පත් කළමනාකරණය

1. **උසස්වීම ලබාදුන් නිලධාරීන් කිසිවෙකු නොමැත**

2. **විශ්‍රාම ගිය නිලධාරීන්**

අංකය	නම	EPF අංකය	තනතුර
1.	ගෝපාලරත්නසිංහම් සාන්තිශ්‍රී මහත්මිය	410	කථිකාචාර්ය
2.	රවීන්ද්‍රන් අම්බිකාපති මහත්මිය	489	කථිකාචාර්ය
3.	කාර්තිගේසු රාසාමෝහන් මහතා	439	කළමණාකාර සහකාර
4.	වල්ලිපුරම් ගුණසේකරරාජන් මහතා	636	කම්කරු
5.	තම්බිරාජා ගුණලක්ෂ්මි මහත්මිය	448	කථිකාචාර්ය
6.	අන්බලහන් වෙල්වරංජිතම් මහත්මිය	408	කථිකාචාර්ය
7.	ධර්මකුලසිංහම් රාජරේඛා මහත්මිය	401	කම්කරු

3. **ඉල්ලා අස්වූ නිලධාරීන්**

අංකය	නම	EPF අංකය	තනතුර
1.	නල්ලතම්බි ගනේෂලිංගම් මහතා	605	කම්කරු
2.	ඒ.ඩී. රාජපක්ෂ මහතා	640	කම්කරු
3.	ගුණරත්නම් කුහාන්දන් මහතා	846	කළමණාකාර සහකාර
4.	නිත්‍යානන්දම් සෝබිනි මෙනෙවිය	812	පර්යේෂණ සහකාර

4. මියගිය නිළධාරීන්

අංකය	නම	EPF අංකය	තනතුර
1.	සින්නතම්බි වදනන් මහතා	654	ක්ෂේත්‍ර නිළධාරි

වගුව **15:** තල් සංවර්ධන මණ්ඩලයේ කාර්ය මණ්ඩලය - **31.12.2024**

අංකය	**31.12.2024** වන විට තනතුරු නාමය	අනුමත වූ කාර්ය මණ්ඩලය	වත්මන්කාර්ය මණ්ඩලය
1	**විධායක ශ්‍රේණිය (සාමාන්‍යාධිකාරි/ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි/ කළමණාකරුවන්)**	**10**	**05**
2	**කණිෂ්ඨ කළමණාකරුවන් (ප්‍රාදේශිය සම්බන්ධීකාරකවරු / තාක්ෂණික නිලධාරීන් / පරිපාලන නිළධාරීන්/ මූල්‍ය නිළධාරීන්)**	**14**	**08**
3	**පර්යේෂණ නිළධාරීන්**	**04**	**03**
4	**කළමණාකරන සහකාර (තාක්ෂණික)**	**47**	**31**
5	**කළමණාකරන සහකාර (තාක්ෂණික නොවන)**	**35**	**31**
6	**පර්යේෂණ සහකාර**	**06**	**04**
7	**පුහුණු හා අර්ධ පුහුණු සේවකයෝ**	**62**	**53**
8	**සෙසු කාර්ය මණ්ඩලය සහ නුපුහුණු සේවකයෝ**	**49**	**42**
9	**අනියම් සේවකයෝ හා පුහුණුලාභී සේවකයෝ**	**-**	**12**
	මුළු සේවක සංඛ්‍යාව	**227**	**189**

5.3.2. තල් සංවර්ධන මණ්ඩලයේ සේවකයින් සඳහා වූ ධාරිතා සංවර්ධන පුහුණුව

තල් සංවර්ධන මණ්ඩලය උතුරු පළාත් කළමණාකරණ සංවර්ධන පුහුණු අංශය සමඟ ඒකාබද්ධ වී විවිධ දිස්ත්‍රික්කවල සේවය කරනු ලබන නිළධාරීන් සඳහා සේවක ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහනක් සංවිධානය කළේය. මෙම වැඩසටහනේ අරමුණ වූයේ නිළධාරීන්ගේ පරිපාලන සහ තාක්ෂණික හැකියාව වර්ධනය කිරීම හා ඒ මගින් රාජ්‍ය අංශයේ ගුණාත්මකභාවය සහ කාර්යක්ෂමතාවය තහවුරු කිරීම වේ. මෙම වැඩසටහන මගින් සහභාගිවූවන් හට රාජ්‍ය ගිණුම්, පරිපාලන ක්‍රමවේදය, ප්‍රසම්පාදනය, දේපළ කළමණාකරණය සහ කාර්යාල නිපුණතාවය වර්ධනය කිරීම සඳහා කෘතිම බුද්ධිය (AI) වැනි නවීන



රූපය 06: ධාරිතා වර්ධන පුහුණුවේ අවස්ථාවන්

මෙවලම් භාවිතය පිළිබඳව ප්‍රයෝගික පුහුණුව සහ යාවත්කාලීන කරන ලද දැනුම ලබා දෙන ලදී. මෙම පුහුණුව නිළධාරීන්ගේ වෘත්තිමය වර්ධනයට දායක විය.

පුහුණුව පිළිබඳ විස්තර

- කාලය : දින 9 ක්
- ස්ථානය : කළමණාකරණ සංවර්ධන පුහුණු අංශය - උතුරු පළාත
- සහභාගිවූවන් : තල් සංවර්ධන මණ්ඩලයේ විවිධ දිස්ත්‍රික්කවලට අයත් නිළධාරීන්

විෂය

- ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති - දින 2 ක්
- පුද්ගලික ගොනු කළමණාකරණය - දින 1 ක්
- ප්‍රසම්පාදන පටිපාටිය - දින 1 ක්
- දේපළ හා භාණ්ඩ සමීක්ෂණය සහ අපහරණ ක්‍රියාවලිය - දින 2 ක්
- කෘතිම බුද්ධි මෙවලම් මගින් කාර්යාල නිපුනතාවය වර්ධනය කිරීම - දින 1 ක්
- කාර්යාල කාර්ය පටිපාටිය - දින 1 ක්
- වාහන නඩත්තුකිරීම් - දින 1ක්

5.3.3 භෞතික සම්පත් කළමනාකරණය

අ) වාහන අංශය මඟින් පහත දැක්වෙන ලේඛන නඩත්තු කෙරේ

1. වාහන සම්බන්ධ දේපළ සඳහා වූ ලේඛණය
2. වාහන අළුත්වැයාව හා අනෙකුත් සේවාවන් සඳහා වූ ලේඛණය

ආ) යටිතල පහසුකම්


1. PTA ඉදිකිරීම් කටයුතුවලින් කොටසක් ආරම්භ කර ඇත.

2. දිස්ත්‍රික් කාර්යාල වැඩි දියුණුව සඳහා වූ ආධාර - හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලය

ප්‍රාදේශීය කටයුතු ශක්තිමත් කිරීම සහ සේවා සැපයීම ප්‍රවර්ධනය කිරීම සඳහා වූ අපගේ වගකීමෙන් කොටසක් වශයෙන් හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලය එදිනෙදා ක්‍රියාකාරකම්වලට අවශ්‍ය සම්පත් සහිතව පිහිටුවා ඇත. මෙම විධිවිධානවල අරමුණ වනුයේ, පරිපාලන කටයුතුවල ධාරිතාව වර්ධනය කිරීම, සේවකයින් හට සාර්ථක සේවා පරිසරයක් බිහි කිරීම සහ දිස්ත්‍රික් කාර්යාලයේ සමස්ථ ක්‍රියාකාරී නිපුණතාවය වර්ධනය කිරීම වේ.

සපයන ලද භාණ්ඩ: පරිඝණක (Desktop Computer), ප්‍රින්ටරය (Printer), කාර්යාල ගෘහ භාණ්ඩ (Office Furniture)

සංවිධාන ව්‍යුහය :


සභාපති
අධ්‍යක්ෂක මණ්ඩලය
සාමාන්‍යාධිකාරී
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
අභ්‍යන්තර විගණක .
කළමණාකරු පරිපාලන හා මානව සම්පත්
කළමනාකරු මූල්‍යය
කළමණාකරු නිෂ්පාදන
කළමණාකරු සංවර්ධන
කළමනාකාරු ව්‍යාප්ති
කළමනාකාරු අලෙවි ප්‍රවර්ධන
කළමනාකාරු ව්‍යවහාරික පර්යේෂණ
විගණන නිලධාරි(02)
පරිපාලන නිලධාරී
තාක්ෂණික නිලධාරී
දිස්ත්‍රික් සම්බන්ධීකාරක(09)
මුදල් නිලධාරී
පර්යේෂණ නිලධාරි (03)
කළමනාකරණ සහකාර (තාක්ෂණික) (34)
පොත් තබන්නා
නිෂ්පාදන සහකාර (04)
සංවර්ධන සහකාර (04)
පර්යේෂණ සහකාර (04)
තාක්ෂණික සහකාර (02)
පර්යේෂණාගාර සහකාර
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) (35)
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
රියදුරු(14)
සංචාරක බංගලා භාරකරු
කළමනාකරණ සහකාර
ක්ෂේත්‍ර සහකාර(08)
කම්කරු(39)
කායාල සහයක(02)
ක්ෂේත්‍ර සහකාර(08)

5.4 නිෂ්පාදන අංශය

තල් සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන අංශයක් ලෙස නිෂ්පාදන අංශය කටයුතු කරයි. මෙම අංශය තල් ගසින් ලබාගත හැකි මූලික ද්‍රව්‍යයන් භාවිතයෙන් සම්ප්‍රදායික ක්‍රම සහ පර්යේෂණමය සොයා ගැනීම් ඔස්සේ ආදර්ශ නිෂ්පාදන සකස් කරයි. වටිනාකම් එකතුකළ තල් ආශ්‍රිත ආහාර නිෂ්පාදන බිහිවීමට හේතු වී ඇත.

තල් ආශ්‍රිත පර්යේෂණාත්මක නිමවුම් මෙම කර්මාන්තයට හඳුන්වා දීම නිෂ්පාදන අංශයේ ප්‍රධාන අරමුණුවලින් එකකි. මෙහිදී වටිනාකම වැඩි කළ ආහාර නිෂ්පාදන ලෙස පාම්පෝෂ (Palmposha),තල් යුෂ,තල් බීම වර්ග,තල් ජෑම්, පනාටු,කේක් වර්ග, බිස්කට් වර්ග, අතුරුපස වර්ග, ක්ෂණික කෝඩියල් යුෂ වැනි භාන්ඩයන් සඳහන් කළ හැක. තල් ආශ්‍රිත නිෂ්පාදකයින්ගේ ජීවනෝපාය නැංවීම සඳහා විවිධ නිෂ්පාදන ආශ්‍රිත උපකරණ ලබා දී ඔවුන් දිරිගන්වමින් නිෂ්පාදනයට අවශ්‍ය මූලද්‍රව්‍ය වන වියලි තල් අල, තල් පිටි, තල් රා, පනාටු, තල් යුෂ ආදී ද්‍රව්‍ය මිලදී ගෙන ආදර්ශ නිෂ්පාදන මධ්‍යස්ථානවල නිෂ්පාදනයට භාවිතා කරනු ලැබේ.

නිෂ්පාදන අංශය විසින් තල් ආශ්‍රිත නිෂ්පාදන කටයුතු සමග නිෂ්පාදන මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමේ කටයුතුද සිදුකරනු ලබයි. ඒ අනුව මෙම වර්ෂයේ දී පහත සඳහන් වැඩසටහන් සම්පූර්ණ කර ඇත.

කරයිනගර් සහ කයිතඩි නිෂ්පාදන මධ්‍යස්ථානවලට GMP (විශිෂ්ඨ නිෂ්පාදන ක්‍රියා පටිපාටිය) තත්ව සහතිකය වර්ෂය සඳහා අළුත් කිරීම සහ ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකර ඇත. ප්‍රාග්ධන අරමුදල යටතේ වෙන්කරන ලද රු. මිලියන 6.25 ක මුදලින් නිෂ්පාදන මධ්‍යස්ථානවල නඩත්තු කටයුතු, අළුත්වැඩියා කටයුතු සහ නිෂ්පාදන මධ්‍යස්ථානවල යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා කිරීම් සහ නිෂ්පාදන උපකරණ මිලදී ගැනීම් සිදුකර ඇත. ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකළ නිෂ්පාදන මධ්‍යස්ථානයන් වන්නේ,

- යාපනය දිස්ත්‍රික්කය - කරයිනගර්, කයිතඩි, සිංගයිනගර් නිෂ්පාදන මධ්‍යස්ථානයන්
- වවුනියාව දිස්ත්‍රික්කය - පුලියන්කුලම නිෂ්පාදන මධ්‍යස්ථානය
- ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය - වරෝධයනගර් නිෂ්පාදන මධ්‍යස්ථානය





රූපය 7: කරෙයිනගර් නිෂ්පාදන මධ්‍යස්ථානය - අභ්‍යන්තර බිත්ති වෙන් කිරීම සිදුකරන ලදී



රූපය 8: කරයිනගට් නිෂ්පාදන කම්හල - අභ්‍යන්තර වෙන් කිරීමේ කටයුතු සිදු කරන ලදී.



රූපය 9: කයිනඩි නිෂ්පාදන මධ්‍යස්ථානය - පිඩන රූපය 10: සිංගයිනගර් නිෂ්පාදන හධ්‍යස්ථානය - තල් රා උණුකිරීම සඳහා වූ තාවකාලික උදුන සහ උදුන (Oven) අළුත්වැඩියා කරන ලදී මඩුව සකස් කරන ලදී.

වගුව **16:** නිෂ්පාදන මධ්‍යස්ථාන විස්තරය

දිස්ත්‍රික්කය	නිෂ්පාදන මධ්‍යස්ථාන	නිෂ්පාදන මධ්‍යස්ථානවල නිෂ්පාදන
යාපනය	කාරයිනගර්	තල් අල ආශ්‍රිත නිෂ්පාදන, තල් රා ආශ්‍රිත නිෂ්පාදන, තල් යුෂ ආශ්‍රිත නිෂ්පාදන
	කයිතඩි	තල් යුෂ ආශ්‍රිත නිෂ්පාදන, තල් රා ආශ්‍රිත නිෂ්පාදන
	සිංගයිනගර්	තල් රා ආශ්‍රිත නිෂ්පාදන, තල් යුෂ ආශ්‍රිත නිෂ්පාදන
මන්නාරම	තරවන්කොටේ	තල් රා ආශ්‍රිත නිෂ්පාදන, තල් යුෂ ආශ්‍රිත නිෂ්පාදන
	පඩප්පඩි	තල් රා ආශ්‍රිත නිෂ්පාදන, තල් යුෂ ආශ්‍රිත නිෂ්පාදන
	කට්ටුකාරන් කුඩියිරුප්පු	තල් රා ආශ්‍රිත නිෂ්පාදන, තල් යුෂ ආශ්‍රිත නිෂ්පාදන
වවුනියාව	පුලියන්කුලම්	තල් අල ආශ්‍රිත නිෂ්පාදන
ත්‍රිකුණාමලය	වරොධ්‍යනගර්	තල් රා ආශ්‍රිත නිෂ්පාදන, තල් යුෂ ආශ්‍රිත නිෂ්පාදන
පුත්තලම	කල්පිටිය	තල් යුෂ නිෂ්පාදන
කොළඹ	වැල්ලවත්ත	තල් චොකලට්, තල් බිස්කට්, තල් කේක්, තල් කැවුම් තට්ටු වඩේ, තල් බීම, තල් ක්‍රෂ්
මඩකලපුව	වෙලිච්චවීටඩි	තල් පානය, තල් යුෂ නිෂ්පාදන

වගුව **17:** තල් සංවර්ධන මණ්ඩලයේ නිෂ්පාදන තොරතුරු

නිෂ්පාදන	ඒකක	2022	2023	2024
තල් රා ආශ්‍රිත නිෂ්පාදන				
හකුරු නිෂ්පාදනය	**මුළු නිෂ්පාදනය (කිලෝ ග්‍රෑම්)**	**6357.254**	**5,820.15**	**4,325.15**
පැණි නිෂ්පාදනය	**මුළු නිෂ්පාදනය (ලීටර්)**	**3952.89**	**6222.90**	**5,772.36**
සූකිරි නිෂ්පාදනය	**මුළු නිෂ්පාදනය (කිලෝ ග්‍රෑම්)**	**29.95**	**11.50**	**13.76**
එල / යුෂ ආශ්‍රිත නිෂ්පාදන				
යුෂ නිෂ්පාදනය	**මුළු නිෂ්පාදනය (ලීටර්)**	**20289.75**	**10,775.25**	**7,030**
සිසිල් බීම නිෂ්පාදනය	**බෝතල් සංඛ්‍යාව (190 මි.ලී.)**	**1759.78**	**8,417**	**8,924**
පාම් ක්‍රෂ් නිෂ්පාදනය	**බෝතල් සංඛ්‍යාව (750 මි.ලී.)**	**2526.00**	**2,081**	**1,825**
ජෑම් නිෂ්පාදනය	**බෝතල් සංඛ්‍යාව (400 මි.ලී.)**	**918.00**	**1,131**	**959**

පනාටු නිෂ්පාදනය	මුළු නිෂ්පාදනය (කිලෝ ග්‍රෑම්)	**318.00**	**526.75**	**676.75**
පනාටු	මුල්ලු මිලදී ගැනීම්	**213.00**	**496.40**	**407.80**
විශේෂ පනාටු නිෂ්පාදනය	මුළු නිෂ්පාදනය (කිලෝ ග්‍රෑම්)	**218.5**	**275**	**687**
තල් හකුරු කේක් නිෂ්පාදනය	නිපදවන ලද ඒකක (පැකට්) සංඛ්‍යාව	**2389.00**	**4,279**	**2,127**
තල් කැවුම් නිෂ්පාදනය නිෂ්පාදනය	නිෂ්පාදනය කරන ලද පැකට් සංඛ්‍යාව	**1995.00**	**3,457**	**2,886**
අනෙකුත් තල් රසකැවිලි නිෂ්පාදන	නිෂ්පාදනය කරන ලද පැකට් සංඛ්‍යාව	**9280.00**	**-**	**827**
අල ආශ්‍රිත නිෂ්පාදන				
තම්බන ලද වියලි අල	මුළු නිෂ්පාදනය (කිලෝ ග්‍රෑම්)	**979.75**	**1248.50**	**1,610.75**
වියළන ලද අල පිටි	මුළු නිෂ්පාදනය (කිලෝ ග්‍රෑම්)	**1916.5**	**2791**	**2,102.75**
තම්බන ලද හා වියළන ලද අල නිෂ්පාදනය	මිලට ගත් මුළු ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්)	**980.5**	**2.619**	**1,054.875**
තම්බන ලද වියළි අල නිෂ්පාදනය (සීවල් ඕඩියල්)	මිලට ගත් මුළු ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්)	**1014.75**	**715**	**843.75**
රවුම් වියළි අල පෙති බැදුම්	මිලට ගත් මුළු ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්)	**681.25**	**527**	**950**
අල නිෂ්පාදනය	මිලට ගත් මුළු ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්)	**2803.60**	**1,752**	**3,500**
ඕඩියල් කූල් නිෂ්පාදනය	නිෂ්පාදනය කරන ලද පැකට් සංඛ්‍යාව (150ග්‍රෑම්)	**75.00**	**262**	**-**
පාම් පෝෂ නිෂ්පාදනය	මුළු නිෂ්පාදනය (කිලෝ ග්‍රෑම්)	**262.5**	**814.25**	**840**
අනිකුත් නිෂ්පාදන				
තල් නොවන නිෂ්පාදන (මෝරු මීරිස්, මාස්මෙලෝ, ග්ලූකෝරස, තට්ටු වඩේ)	මුළු නිෂ්පාදනය (පැකට්)	**1157.00**	**1090**	**611**
විකිණුම් බවට හරවන ලද නිෂ්පාදිතයෙහි වටිනාකම (රුපියල් මිලියන)		**20.59**	**34.10**	**38.82**

5.5 අලෙවි අංශය:

තල් සංවර්ධන මණ්ඩලයේ කට්පහම් අලෙවි මධ්‍යස්ථාන හරහා මෙන්ම ප්‍රදර්ශන සහ ජංගම අලෙවි වැඩසටහන්වල දායකත්වය ලබාදී මණ්ඩලයේ අලෙවි කටයුතු ඉදිරියට ගෙන යනවා. අලෙවි කිරීම් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් යුතුව කට්පහම් අලෙවි මධ්‍යස්ථාන නවීකරණය කිරීමෙන් සහ අපනයන වෙළඳපොළ ඉලක්ක කර අපනයනකරුවන් දිරිගන්වමින් අපනයන බලපතු ලබාදීම සහ අපනයනකරුවන් සහ නිෂ්පාදකයින් සම්බන්ධීකරණය කිරීමේ කටයුතු ද සිදුකරනු ලැබේ.

වගුව 18 : කට් පහම් අලෙවි මධ්‍යස්ථාන පිහිටි ස්ථාන පිළිබඳ විස්තර

දිස්ත්‍රික්කය	පිහිටීම
යාපනය	පේදුරුතුඩුව පාර, නල්ලූර්, යාපනය
	බස් නැවතුම්පොළ, යාපනය
කොළඹ	අංක - 498, මෙගා සිටි කට්පහම්, ගාලු පාර, කොළඹ
මහනුවර	අංක -309, පේරාදෙණිය පාර, මහනුවර
මන්නාරම	මඩු පාර, මන්නාරම
	මන්නාරම නගරය, මන්නාරම
මඩකලපුව	15 යු.ඩි. ඒ ගොඩනැගිල්ල, මඩකලපුව
	ප්‍රදර්ශන ශාලාව, ප්‍රදීපාගාරය, මඩකලපුව
ත්‍රිකුණාමලය	ප්‍රදීපාගාර පාර, ත්‍රිකුණාමලය
	ප්‍රධාන පාර, වරොධ්‍ය නගරය, ත්‍රිකුණාමලය
අම්පාර	68, නාවිධන්වෙළි, කල්මුනේ.
වවුනියාව	67-68, වෙළඳසැළ පාර, වවුනියාව
පුත්තලම	නව බස් නැවතුම්පොළ, කල්පිටිය
හම්බන්තොට	පන්සල ඉදිරිපිට, තිස්සමහාරාමය

වගුව- 19: පසුගිය අවුරුදු 3ක කට්පහම් **අලෙවි මධ්‍යස්ථානවල මුළු අලෙවිය**

දිස්ත්‍රික්කය	මධ්‍යස්ථානය	2022	2023	2024
යාපනය	නල්ලූර්	10,239,084.80	18,581,319.45	21,427,980.44
	බස් නැවතුම්පොළ	1,975,365.90	1,733,480.00	1,459,496.00
	කයිතඩි	910,028.00	1,590,545.00	-
	කාර්ගිල්ස්	105,040.00	254,305.00	125,070.00
	ප්‍රදර්ශනය	1,053,796.00	2,815,181.00	2,271,575.00
කොළඹ	මෙගාසිටි,	13,924,394.99	17,142,074.40	17,044,660.05
මහනුවර	කට්පහම්	5,286,400.20	6,886,818.99	6,280,470.42
වවුනියා	කට්පහම්	2,769,835.00	4,254,065.00	4,801,840.00
මඩකලපුව	කට්පහම්	4,231,381.00	2,379,440.00	3,123,745.00

	ප්‍රදර්ශන ශාලාව	2,567,412.00	857,715.00	544,560.00
අම්පාර	කට්පහම්	551,411.00	302,536.00	9,435.00
මන්නාරම	කට්පහම්	2,184,223.00	3,963,737.00	1,789,346.20
	මඩු කට්පහම්	597,344.00	664,290.00	82,195.00
ත්‍රිකුණාමලය	කට්පහම්	1,010,350.00	1,249,665.00	909,961.00
	වරොධ්‍ය නගරය	144,870.00	577,647.50	881,572.50
පුත්තලම	කට්පහම්	49,710.00	291,916.00	257,942.00
හම්බන්තොට	වීරවිල	227,969.50	361,156.00	1,152,549.00
	තිස්සමහාරාමය	459,745.00	651,387.50	650,697.00
කිලිනොච්චි	කට්පහම්	82,109.00	346,615.00	138,613.18
එකතුව		50,057,661.39	65,416,756.84	62,951,707.79

5.5.1. තල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය

තල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය දිරිගැන්වීම සහ විධිමත් කිරීම උදෙසා තල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනකරුවන්ගේ හමුවක් සංවිධානය කරන ලදී. ලියාපදිංචි වී සිටින අපනයනකරුවන්ගෙන් ලැබුණු දත්ත අනුව, 2024 වර්ෂයේ තල් ආශ්‍රිත නිෂ්පාදන අපනයන සමස්ත වටිනාකම රු. මිලියන 228.69ක් විය.

2024 වසරේදී අලෙවිකිරීමේ අංශය මගින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති



රූප 11: යාපනය වෙළඳ ප්‍රදර්ශනය – 2024



රූප 12: හම්බන්තොට බද්දර ප්‍රදර්ශනය

5.6 පර්යේෂණ අංශය

5.6.1. විශ්ලේෂණ විද්‍යාගාරය

5.6.1.1 අනුමත සහ ISO මෙහෙයුම්

2017 සිට SLAB සහ ILAC විසින් ISO 17025:2017 සම්මතය සඳහා ලබාගෙන ඇත. 2024.02.10 සිට 2028.02.09 දක්වා දීර්ඝ කර ඇත

5.6.1.2 පරීක්ෂණ සේවාවන්

පරීක්ෂණ වාර්තා 491ක් ලබාදීම මගින් රු. මිලියන 2.61 ක ආදායමක් උපයා ගන්නා ලදී.

5.6.1.3. පුහුණුව සහ වැඩමුළු

වගුව **20:** සිසුන් සඳහා අධ්‍යයන පුහුණුව

සිසුන් සඳහා වූ පුහුණුව	සිසුන් සංඛ්‍යාව	කාලය (මාස)
යාපනය විශ්වවිද්‍යාලය	05	06
යාපනය විශ්ව විද්‍යාලය	04	03
නැගෙනහිර විශ්ව විද්‍යාලය	02	01
රජරට විශ්ව විද්‍යාලය	04	03
SLGTI	06	03
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	01	04
ශ්‍රී ලංකා සමුද්‍රීය විශ්ව විද්‍යාලය	01	01

නිෂ්පාදකයින් සඳහා වූ පුහුණුව

1. හකුරු නිෂ්පාදන - පුනරීන් තල් හා පොල් සංවර්ධන සමූපකාර සමිතිය

2. කුකීස් පුහුණුව - ආරුදල් භාරය

3. ජෙලි යෝගට් නිෂ්පාදනය - විදාතා ප්‍රතිලාභීන්

4. Sea cucumber quality training - OPENE ප්‍රතිලාභීන්

5. මුහුදු පාසි තත්ව පුහුණුව - OPENE ප්‍රතිලාභීන්

5.6.2. ක්ෂුද්‍රජීව විද්‍යාගාරය

5.6.2.1. අනුමත සහ ISO මෙහෙයුම

SLAB විසින් ISO 17025:2017; අනුමතිය සඳහා වූ SLAB පරීක්ෂණය අවසන් විය. ජාතික ජල සම්පාදන සහ ජලප්‍රවාහන මණ්ඩලය විසින් ISO අණුකූල විශ්ලේෂණයක් සිදු කරන ලදි.

5.6.2.2. පරීක්ෂණ සේවාවන්

පරාමිතිකයන් 445ක් සහිත පරීක්ෂණ වාර්තා 193ක් නිකුත් කරන ලදී.

5.6.2.3. පුහුණුව සහ වැඩමුළු

- ආහාර සඳහා වූ විද්‍යාගාර පරීක්ෂණ සේවාවන් සඳහා වැඩමුළුවක් පැවැත්වීම (මුහුදු පාසි නිෂ්පාදකයින්, OPENE, මන්නාරම)
- PDCS සහ කාන්තා සමිති සඳහා වූ පල්ප සංරක්ෂණ පුහුණුව
- වසර පුරා විශ්ව විද්‍යාල සහ පාසැල් සිසුන් 30 කට සෘජු පුහුණුව සහ විද්‍යාගාරයට පැමිණ පුහුණුව ලබා දෙන ලදී.
- යාපනය විශ්ව විද්‍යාලයේ සිද්ධ වෛද්‍ය පීඨ සිසුන් සඳහා හකුරු නිෂ්පාදනය සහ පළතුරු යුෂවලින් මී කිරි නිෂ්පාදනය, තත්ව පාලනය, තල් හකුරුවලින් කුකීස් නිෂ්පාදනය කිරීම සහ තත්ව පාලනය පිළිබඳ පුහුණුව

5.6.2.4. ප්‍රදර්ශණ

Yarl IT Hub හි පර්යේෂණ ප්‍රකාශණ ප්‍රදර්ශණය කරන ලදී.

5.6.3. ආහාර තාක්ෂණ විද්‍යාගාරය

5.6.3.1. පර්යේෂණ විශේෂාංග

- තල් සහ අඹ පල්ප සහ තල්-අඹ යුෂ හි පවතින සෞඛ්‍ය ප්‍රතිලාභ
- තල් යුෂ සහ මල් වර්ග යොදාගෙන ස්වභාවික දියර සබන් සකස් කිරීම සහ තත්ව පාලනය.
- තල් සම්පත් යොදාගෙන ක්‍රකර්ස් සකස් කිරීම
- තල් සම්පත් යොදාගෙන ක්ෂණික බීම වර්ග සකස් කිරීම
- තල් පැළ භාවිතා කර නෙල්ලි පදම්කිරීමේ ද්‍රව්‍ය සකස් කිරීම සහ එහි පෝෂණ මිශ්‍රණය තීරණය කිරීම.

- පිරිමි තල් ශාඛ සහ පත්‍ර යොදාගෙන ඖෂධීය වියලි ෂැම්පූ කුඩු සකස් කිරීම

5.6.3.2. පුහුණුව සහ වැඩමුළු

- තල් ආශ්‍රිත සමිති සඳහා තල් යුෂ සංරක්ෂණය පිළිබඳ පුහුණු සැසි තුනක් පවත්වන ලදී.
- 2024 අගෝස්තු 5 සහ 6 දිනයන්හි නාවිදන්වෙලි දිස්ත්‍රික් කාර්යාලයේ පිහිටි විදාත අංශයේ ප්‍රතිලාභීන් 30 දෙනෙකුට තල් පල්ප පදනම් කරගත් සබන්, ෂැම්පු මුහුණ සේදීමේ ද්‍රව සකස්කිරීම පිළිබඳ පුහුණුව ලබදෙන ලදී. 2024 අගෝස්ත1 13 දින තල් පර්යේෂණ මධ්‍යස්ථානයේ දී ප්‍රතිලාභීන් 30 දෙනෙකුට තල් ආලේපන ක්‍රීම් සහ සබන් නිෂ්පාදනය පිළිබඳ පුහුණුව ලබාදෙන ලදී.
- සිසුන් 11 දෙනෙකුට කර්මාන්ත පුහුණුව ලබාදෙන ලදී.

5.6.3.3 ප්‍රකාශන:

ජාත්‍යන්තර සමුළුවලදී පර්යේෂණ සංක්ෂිප්තයන් දෙකක් පිළිගන්වන ලදී. තවද, එක් පර්යේෂණ නිබන්ධනයක් සම ඇගයීම් සඟරාවක ප්‍රකාශයට පත්කරන ලදී.

5.6.4. උසස් තාක්ෂණ විද්‍යාගාරය

5.6.4.1 පර්යේෂණ විශේෂාංග

- වෙළඳපොල සාම්පල සහ තල් හකුරුවල තත්ව පාලන සාම්පල අතර සංසන්දනය - මිශ්‍රකිරීම් හඳුනාගැනීම සඳහා වූ මූලික පරීක්ෂණ සිදුකිරීම.
